# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2480/05 – 2026 මාර්තු මස 16 වැනි සඳුදා – 2026.03.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2024/67.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

එච්. බී. උපවංශ මයා
අංක 1/10,
ආරබැද්ද,
උඩමලල,
හම්බන්තොට

සහ

ලංකා සෝල්ට් ලිමිටඩ්,
මහලේවාය,
හම්බන්තොට

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිළියන්දල, බුද්ධාලෝක පාර, අංක 40, ආචාර්ය කේ. ඒ. තිලකරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2026 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී.

මගේ අංකය: IR/COM/03/2024/67.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්. බී. උපවංශ මයා
අංක 1/10,
ආරබැද්ද,
උඩමලල,
හම්බන්තොට

සහ

ලංකා සෝල්ට් ලිමිටඩ්,
මහලේවාය,
හම්බන්තොට.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට
හේතු වී පවත්නා කරුණ වනුයේ

"ලංකා සෝල්ට් ලිමිටඩ්හි ආරක්ෂක සහකාර I තනතුරේ සේවය කරන එච්. බී. උපවංශ මහතාට නියමිත පරිදි 2023 වසරේ ආරක්ෂක නිලධාරී තනතුර සඳහා උසස්වීම ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී ඇත්ද එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ලබාදිය යුතු සහන කවරේද යන්න වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 පෙබරවාරි මස 11 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ,
කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 03-0137

මගේ අංකය: IR/COM/03/2024/155.

---

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

පී. ටී. කේ. පී. ප්‍රනාන්දු මහතා,
අංක 18,
හයිවේ ග්‍රීන්,
දෙල්දූව,
වාද්දූව

සහ

ශ්‍රී ලංකා තේ මණ්ඩලය
අංක 574,
ගාලු පාර,
කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රාජගිරිය, ඔබේසේකරපුර, ඇසළ උද්‍යාන පාර, අංක 46/7, අහමඩ් ලෙබ්බෙ මොහමඩ් සලීම් මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2026 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී.

මගේ අංකය: IR/COM/03/2024/155.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන**
**කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී. ටී. කේ. පී. ප්‍රනාන්දු මහතා,
අංක 18,
හයිවේ ග්‍රීන්,
දෙල්දූව,
වාද්දූව

සහ

ශ්‍රී ලංකා තේ මණ්ඩලය
අංක 574,
ගාලු පාර,
කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) III ශ්‍රේණියේ සේවය කරන පී. ටී. කේ. පී. ප්‍රනාන්දු මහතා කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) II ශ්‍රේණියට උසස් නොකිරීම මඟින් ඔහුට අසාධාරණයක් සිදුවී ඇත්ද එසේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 පෙබරවාරි මස 06 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ,
කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 03-0138

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.